# ලංසු ඉල්ලුම් පත්‍රය
# බළන්ගොඩ නගර සභාව.

බළන්ගොඩ නගරයේ (අමුණා ඇති උපලේඛණයේ වැඩිදුරටත් විස්තර කරනු ලබන පරිදි) මාර්ග අතුගෑම, කැලි කසල එකතු කිරීම,අවසාන බැහැරලීම, දක්වා ගෙනයාම කාණු වලින් ගොඩ දමන පස් එකතු කිරීම මාර්ගවල වැලි ඉවත් කිරීමේ සේවාව , නව බස්නැවතුම්පොල සහිත වෙළඳ සංකීර්ණ ගොඩනැගිල්ල හා බස්නැවතුම්පොළ භූමිය හා පොළ ඇතුළත්ව නගර සභාව විසින් වෙන් කරදෙනු ලබන මාර්ග වල අත් කරත්තයෙන් කසල ඉවත් කිරීම ද ඇතුළුව දෛනිකව සේවකයින් 15 දෙනෙකු අදාළ කාර්යය සඳහා යොදවා ගැනීම පිණිස නගර සභාව විසින් සපයනු ලබන ට්‍රැක්ටර් හා රියදුරන් උපයෝගී කරගනිමින් මෙකී සේවාව 2009.10.01 දින සිට 2010.09.30 දින දක්වා පවත්වාගෙන යාම සඳහා නගර සභා ආඥා පනතේ 36 (ඊ) වගන්තිය සහ 40 වන වගන්තිය අනුව සේවාව බදුදීම සඳහා ලංසු ඉල්ලීම.

01. ලංසු පෝරම නිකුත් කල දිනය : ..................................................

02. නිකුත් කරන ලද්දේ කාටද යන වග :..............................................

03. ලංසුකරුගේ ලියුම් ලැබෙන පිළිවෙල: ...........................................

..........................................................................................................

04. ආපසු ගෙවන ඇප තැන්පත් මුදල හා ලදුපත් අංකය: ...................

05. ලංසු පෝරම ගාස්තු හා ලදුපත් අංකය :.......................................

06. ලදුපත් නිකුත් කරන ලද නිලධාරී තැනගේ අත්සන: .......................

07. ලංසුකරුගේ හැඳුනුම්පත් අංකය: .................................................

08. ලංසුකරුගේ අත්සන: .................................................................

| | |
|---|---|
| ................................. | ........................................ |
| දිනය | සභාපති/ලේකම්<br>බළන්ගොඩ නගර සභාව |

# ලංසු ඉල්ලුම් පත්‍රය
# බළන්ගොඩ නගර සභාව

බළන්ගොඩ නගර සභා සීමාව තුළ මීට අමුණා ඇති උපලේඛණය අනුව සියලුම මාර්ග අතු ගා එකතු වන ඝන අපද්‍රව්‍ය ඉරිදා පොළ, නව බස්නැවතුම්පළ සහිත වෙළඳ සංකීර්ණ ගොඩනැගිල්ල හා බස්නැවතුම්පොළ භූමිය ද ඇතුළත්ව දිවා හා රාත්‍රී ලෙස එකතු කර අවසාන බැහැරලීම සඳහා  බැංකියවත්ත දක්වා ගෙන යාම සදහා වු ලංසුව.

| | වැඩ විස්තරය | මුදල |
|---|---|---|
| 01. | බළන්ගොඩ නගර සභාව විසින් මෙයට අමුණා ඇති උපලේඛණයේ සවිස්තරව දක්වා ඇති  වැඩිදුරටත් විස්තර කරනු ලබන මාර්ග සියල්ල දිනපතා අතුගෑම සේවා මුර දෙකකට අතුගා කසල ඉවත් කිරීම සෑම ට්‍රැක්ටර් රථයක් සඳහාම කසල එකතු කර ඉවත් කිරීම සඳහා කම්කරු වන් දෙදෙනෙකු බැගින් යෙදවීම, මාර්ග අතුගෑම සඳහා දිනපතා කම්කරුවන් තිදෙනෙකු යෙදවීම , දිනපතා බස්නැවතුම්පල හා වෙළඳ සංකීර්ණයේ පොදු ස්ථාන දිනකට දෙවරක් අතුගෑම හා කසල එකතු කිරීම ලංසු ඉදිරිපත් නොකරන ලද වැසිකිලි පිරිසිදු කිරීම, පොළ සහ පොදු වෙළඳසල , කසල එකතු කර ඉවත් කිරීම වෙන් කරදෙනු ලැබු මාර්ග වල අත්කරත්ත මගින් කසල ඉවත් කිරීම, මසකට වරක් කාපට් කරනු ලැබු මාර්ග වල වැලි ඉවත් කිරීම, එකතු කරනු ලැබු සියළුම කසල බැංකියවත්ත දක්වා ප්‍රවාහනය කිරීම මාළු වෙළඳසලේ මාළු අපද්‍රව්‍ය වෙනම බැංකියවත්ත දක්වා ප්‍රවාහනය කිරීම ඇතුළුව මසකට කම්කරු දින 458 කට යටත්ව නගර සභාව අත්‍යාවශ්‍ය සේවා මත සභාපති/ලේකම් හා මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් පවරනු ලබන පිරිසිදු කිරීමේ හා කසල එකතු කිරීමේ සේවාවක් පවත්වාගෙන යාම සඳහා අයකරන ගාස්තුව | .................... |

ඉහත දැක්වෙන වැඩ විස්තරයේ සඳහන් සේවා 2009 ඔක්තෝබර් මස 01 දින සිට 2010 09.30 වෙනි දින දක්වා කාලය සඳහා රුඃ ..............................................( අකුරින් ) රුඃ ..................................( ඉලක්කමින්) මුදලකට බළන්ගොඩ නගර සභාව වෙත සැපයීමට .......................................පදිංචි ........................................................................................ වන මම මෙයින් පොරොන්දු වෙමි.

එසේම ලංකා නීති ප්‍රඥප්තියේ 255 අධිකාරිය වු නගර සභා ආඥා  පනතේ 36 (ඊ) වගන්තිය ප්‍රකාරව එළැඹෙන ගිවිසුමකට යටත්ව ඉහත කී සේවාව සැපයීමට එකගවන අතර, ගිවිසුමේ යම් කොන්දේසි කඩකිරීමක දී ඉහත කී පනතේ 211,212 වගන්ති අනුව අධිකරණ ක්‍රියාමාර්ගයක් ගත හැකි බව දන්නා අතර, ඊට ද එකග වෙමින් හා බළන්ගොඩ නගර සභාව විසින් පනවා ඇති හා මතුවට පනවනු ලබන අතුරු ව්‍යවස්ථා හා පාරිසරික සෞඛ්‍ය සුරැකීම සඳහා ශ්‍රී ලංකා ජනරජය විසින් පනවා ඇති සහ මතුවට පනවනු ලබන වෙනත් අණපනත් සහ රෙගුලාසි වලට අනුව කටයුතු කරන බවද මෙයින් පොරොන්දු වෙමි.

එසේම නගර සභා ආඥා පනතේ හා අතුරු ව්‍යවස්ථාවේ කසල කළමනාකරණය සම්බන්ධයෙන් පනවා ඇති සියළුම ගිවිසුම් ප්‍රකාර කොන්දේසි වලට යටත්ව කටයුතු කිරීමට එකග වෙමි.

දිනයඃ .................................                ..........................................

ලංසුකරුගේ අත්සන.

(ලංසු පත්‍රය සමග මෙය අමුණා ඉදිරිපත් කල යුතුය)

**බළන්ගොඩ නගරය තුළ තිබෙන සියළුම මාර්ග හා බස්නැවතුම්පල සහිත වෙළඳ සංකීර්ණ ගොඩනැගිල්ල හා බස්නැවතුම්පොළ භූමියද ඇතුළත්ව දෛනිකව පිරිසිදු කර එකතු කරනු ලබන කැලිකසල දිරා රාත්‍රී දෛනිකව නගර සභාවේ ට්‍රැක්ටර් මගින් බැංකියවත්ත දක්වා ප්‍රවාහනය කිරීමේ සේවාව හා අත්‍යවශ්‍ය හේතු මත සභාපති, ලේකම්, මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් පවරනු ලබන පිරිසිදු කිරීම් වලට අදාළ සේවාවන් පවත්වාගෙන යාම ලංසු කැඳවීම පිළිබඳ විස්තරය හා කොන්දේසි.**

01. නගර සභා ආඥා පනතේ 36(ඊ) වගන්තිය හා අතුරු ව්‍යවස්ථානුකූලව ලංසු අවලංගු කිරීමට යටත්ව මෙහි සේවාව බදුදෙනු ලැබේ.

02. ලංසු පිටපත් 02 කින් යුක්ත විය යුතුය. "මුල් පිටපත" හා "අනුපිටපත" වෙන් වෙන් වශයෙන් ලියුම් කවර 02 ක බහා ලාකඩ මුද්‍රා තබා එම එක් එක්ලියුම් කවරයේ දකුණු කෙළවර මුදුනේ අදාල පරිදි "මුල්පිටපත" හෝ"අනුපිටපත" යනුවෙන් සඳහන් කර නැවත එම ලියුම් කවර දෙක ලොකු ලියුම් කවරයක බහා එම ලියුම් කවරයේ වම් කෙළවර මුදුනේ "**බළන්ගොඩ නගරයේ පිරිසිදු කිරීමේ සේවාව පවත්වාගෙන යාම**" යනුවෙන් සඳහන් කර ලාකඩ මුද්‍රාතබා ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ අතින් ගෙනැවිත් බළන්ගොඩ නගර සභා කාර්යාලයේ තබා ඇති ලංසු පෙට්ටියේ බහාලීම කල යුතුය.

03. ලංසු වල වෙනස් කර හෝ මකා තිබෙන සියළුම තැන්වල ලංසුකරුගේ අත්සන යෙදිය යුතුය.

04. ලංසු ආකෘති පත්‍ර ආදිය ලබාගැනීමෙන් පසුව නියමිත වේලාවට කලින් ලංසු ඉදිරිපත් කිරීමට අපොහොසත් වන, එසේම කොන්දේසි උල්ලංඝණය කර ඇති ඇති බව අනාවරණය වුවහොත්, ඒ අයගේ ඇප ලංසු තැම්පත් මුදල් ඔවුන් වෙත ආපසු නොගෙවා සභාව සතු කරනු ලැබේ.

05. යම්කිසි ලංසුකරුවකුගේ ලංසු පිළිගතහොත් ඔහු විසින් ගිවිසුම් ඇප වශයෙන් රුපියල් දහදාහක් (රු.10,000/-) ලංසු විවෘත කර පැය 01 ක් ඇතුළත මුදලින් නගර සභා කාර්යාලයේ තැම්පත් කළ යුතුය. එසේ කිරීමට අපොහොසත් වන ලංසුකරුගේ ලංසු අවලංගු කර තැම්පත් කර ඇති මුදල් සභාව සතු කරනු ලැබේ.

06. තම ලංසු පිළිගතහොත් ඉහත කී ඇප මුදල් තැම්පත් කිරීමට සුදානම් වී ලංසුකරු හෝ ඔහුගේ නියෝජිතයෙකු අනිවාර්යයයෙන්ම පැමිණ සිටිය යුතුය.

07. පිළිගත් ලංසුකරු විසින් ලංසු පිළිගෙන දින 14 ක් ඇතුළත ලංසුකරු විසින් සභාව සමග වහාම ගිවිසුමකට එළඹිය යුතුය. එසේ ගිවිසුමකට එළඹීමට අපොහොසත් වන ලංසුකරුගේ ලංසු අවලංගු කර එතෙක් තැම්පත් කර ඇති සියළු තැම්පත් සභාව සතු කරනු ලැබේ.

08. පිළිගත් ලංසුකරු විසින් එම සේවා කටයුතු 2009.10.01වෙනි දින සිට ආරම්භ කල යුතු අතර, එදින සිට 2010.09.30 වෙනි දින දක්වා අඛණ්ඩව දිනපතා (රජයේ නිවාඩු දිනයන් ද ඇතුළුව) සේවය සැපයිය යුතුය.

09. පිළිගත් ලංසුකරු විසින් දිනපතා පෙ.ව.05.00 ට එම සේවා කටයුතු ආරම්භ කලයුතු වේ.

10. ලංසුකරුගේ සේවාව පිළිබඳ නාගරික මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් හා වැඩ පරීක්ෂක විසින් දෛනික වාර්තා ලබාගන්නා අතර, ඔවුන්ගේ නිර්දේශයන් සැලකිල්ලට ගෙන සේවාවන් පැහැර හැරීමක් හෝ සේවාවන් නොසැපයීම පිළිබඳ නිර්දේශ කිරීමෙන් පසු ගෙවිය යුතු මුදලෙන් යම් මුදල් ප්‍රමාණ අඩු කිරීමට කටයුතු කරනු ලැබේ. ඒ අනුව ලංසු පත්‍රය අනුව ගිවිසගෙන ඇති මුදල සමානුපාතිකව අඩු කරනු ලැබේ.

11. පිළිගත් ලංසුකරු විසින් දිනපතා සපයනු ලබන සේවාව අධීක්ෂණය කිරීම සඳහා නගර සභාවේ සෞඛ්‍ය පරිපාලක, මහජන සෞඛ්‍ය පරීක්ෂක හා ලේකම් යන නිලධාරීන්ට බලය පැවරෙන අතර එකී අධීක්ෂණ නිලධාරීන් විසින් ලංසුකරුගේ සේවා කටයුතු පිළිබඳව අධීක්ෂණ වාර්තා සැපයිය යුතු අතර, එසේ සපයනු ලබන වාර්තා සැලකිල්ලට ගෙන අවශ්‍ය ඕනෑම අවස්ථාවක ඒ පිළිබඳ විමර්ශනය කිරීමෙන් පසු ලංසු අවලංගු කල හැකි බව දැනගත යුතුය.

12. මෙම සේවාව සඳහා සුදුසු සේවකයින් යොදා ගැනීම ලංසුකරු කලයුතු අතර, එම සේවකයන්ගේ EPF හෝ ETF හෝ දීමනා පිළිබඳ නගර සභාවේ වගකීමක් නොමැති බව දැනගත යුතුය. එසේම මෙම සේවයට යොදා ගන්නා සියලුම සේවකයින්ට ලා දුඹුරු වර්ණයෙන් නගර සභාවේ උපදෙස් පරිදි මසන ලද ජැකට් සැපයිය යුතු අතර, ඒවා සේවා කාලය තුළ පැලඳ සිටින බවට සහතික විය යුතුය.

13. සේවා සැපයීමේ දී මහජනතාවට හිරිහැරයක් කරදරයක් පීඩාවක් නොවන පරිදි කටයුතු කල යුතු අතර, මෙම සේවාව විනිතව හා නීති ගරුකව කටයුතු කිරීමට ලංසුකරු හා ඔහුගේ නියෝජිතයින් වගබලා ගත යුතුය.

14. රටේ පවතින ආරක්ෂිත තත්ත්වය අනුව දේපළ හා මහජනතාවගේ ජීවිත වල ආරක්ෂාව සහතික කිරීම සඳහා අනන්‍යතාවය තහවුරු කල හැකි විශ්වාසවන්ත සේවකයින් සේවයෙහි යෙදවීමට පිළිගත් ලංසුකරු වගබලා ගත යුතුය.

15. ලංසුකරු විසින් සේවයේ යොදවනු ලබන කම්කරුවන්ගේ පහසුකම් හෝ ආරක්ෂාව දීමනා වරප්‍රසාද සම්බන්ධයෙන් කිසි විටත් නගර සභාව විසින් වගකියනු නොලැබේ.

16. පිළිගත් ලංසුකරු වෙතින් සේවය සැපයීමට ගිවිසගෙන ඇති සේවා කාලය නිමවීමට පෙරාතුව, තම සේවය අවසන් කිරීමට ලංසුකරු අපේක්ෂා කරනු ලබන්නේ නම්, නගර සභාවට එක් ලිත් මාසයක කල්දීමෙන් පසුව ඔහුට එසේ කල හැකිය.

17. මෙහි සඳහන් කොන්දේසි කිසිවක් කඩකර ඇති බව ලංසු පිළිගැනීමට පෙර හෙළිවුවහොත් එම ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි අතර, ලංසු පිළිගැනීමෙන් පසු කවර අවස්ථාවක දී වුවද කොන්දේසි කඩකර ඇති බව හෙළිවුවහොත්, ලංසු අවලංගු වීමට එම කරුණු ප්‍රමාණවත් වේ.

18. පිළිගත් ලංසුකරු විසින් ගිවිසගෙන ඇති පරිදි තම සේවා කටයුතු නිසි පරිදි ඉටුකරනු නොලැබුවහොත් හෝ සතුටුදායක ලෙස සේවය සැපයීම පැහැර හැරයහොත් ඒ හේතුවෙන් ලංසු අවලංගු කරන බවට ලංසුකරුට ලිඛිත දැණුම් දීමකින් අනතුරුව මෙම ලංසු අවලංගු කිරීමට නගර සභාවේ ලේකම්තුමාට හෝ ඔහුගේ ඇවෑමෙන් පත්වන වෙනත් අයෙකුට බලය තිබේ. එවැනි අවස්ථාවක දී ලංසුකරු විසින් තැම්පත් කර ඇති ගිවිසුම් ඇපය ඔහුට ආපසු නොගෙවා සභාව සතු කරනු ලැබේ.

19. සෑම ලංසු පෝරමයක් සමගම බළන්ගොඩ නගර සභා බල ප්‍රදේශය තුළ පදිංචි අයෙකු තම සේවාව පිළිබඳ නගර සභාවේ මහජන සෞඛ්‍ය පරීක්ෂකගෙන් ලබාගත් සේවා සහතිකයක් ඇමිණිය යුතු අතර, නගර සභා බල ප්‍රදේශයෙන් පිටත පදිංචි අයෙකු නම් ඒ පිළිබඳ පළපුරුදු සහතිකය ඇමිණිය යුතුය.

20. පිළිගත් ලංසුකරු ගිවිසුම් අත්සන් කිරීමට පෙර බළන්ගොඩ නගර සභා සීමාව තුළ ස්ථිර පදිංචි දෙදෙනෙකුගෙන් ලංසුකරුගේ චරිතය පිළිබඳ සහතික 02 ක් , පදිංචිය පිළිබඳ ග්‍රාම නිලධාරී සහතිකය සහ ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් සභාව වෙත ඉදිරිපත් කල යුතුය.

21. මීට අමතරව මේ සම්බන්ධයෙන් බළන්ගොඩ නගර සභාවේ සභාපතිතුමා හෝ ලේකම්තුමා විසින් පනවනු ලබන වෙනත් ඕනෑම කොන්දේසියකට පිළිගත් ලංසුකරු යටත් විය යුතුය.

22. ලංසුව පිළිබඳ අවසාන තීරණය නගර සභාවේ සභාපතිතුමා හෝ ලේකම්තුමා ප්‍රධාන ප්‍රසම්පාදන මණ්ඩලය සතුය.

.......................................
ලංසුකරුගේ අත්සන.

දිනය: ..............................

..............................................
සභාපති/ලේකම්,
බළන්ගොඩ නගර සභාව.

# බළන්ගොඩ නගර සභාව - ප්‍රසම්පාදන දැන්වීම

2009.10.01 දින සිට 2010.09.30 දින දක්වා බළන්ගොඩ නගර සභා සීමාව තුළ සියළුම මාර්ග වල කසල එකතු කිරීම , පිරිසිදු කිරීම , ප්‍රවාහනය කිරීම හා බස්නැවතුම්පල , පොළ භූමිය සහ පොදු වෙළඳසල මනාව පිරිසිදු කිරීමේ සේවාව සඳහා ශ්‍රමිකයන් ලබාගැනීමේ ලංසු කැඳවීම.

බළන්ගොඩ නගර සභාවේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති වන මා විසින් පිරිසිදු කිරීමේ සේවාව පවත්වාගෙන යාම සඳහා අනුමත කාර්ය මණ්ඩලය පුරප්පාඩු සම්පූර්ණ නොවීම හේතුවෙන් නගරය පවිත්‍ර කිරීම , කැලිකසල එකතු කිරීම එවා ඉවත් කිරීම හා අවසාන බැහැරලීම දක්වා ගෙන යාම ඇතුළුව නගර සභාව විසින් පාලනය කරනු ලබන බස්නැවතුම්පල , පොළ භූමිය , පොදු වෙළඳසල පිරිසිදු කිරීම හා අපවිත්‍ර ද්‍රව්‍ය ඉවත් කිරීම ඇතුළුව නගර සභාව විසින් නම් කර ඇති ප්‍රදේශ කරත්ත වලින් කසල ඉවත් කිරීමේ සේවාව ශ්‍රමිකයන් යොදා පවත්වාගෙන යාම සඳහා 2009 සැප්තැම්බර් 24 පෙ.ව.09.30 දක්වා ලංසුපත් භාරගනු ලැබේ.

02. 2009.09.23 වන දින ප.ව.03.00 දක්වා ලංසු පෝරම නිකුත් කරනු ලබන අතර, කමිටුවේ සභාපති වෙත ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ මෙම ආයතනයේ තබා ඇති ලංසු පෙට්ටියට බහාලීම කළයුතුය. වැඩිදුර විස්තර 045-2287275 හෝ 045-2286586 මගින් බළන්ගොඩ නගර සභාවේ නාගරික ලේකම්ගෙන් ලබාගත හැකිය. ඊට අමතරව බළන්ගොඩ නගර සභාවේ නිල වෙබ් අඩවිය වන www.balangoda.uc.gov.lk ට පිවිසීමෙන් ලබාගත හැක.

03. ලංසු විවෘත කිරීම 2009.09.24 වන දින පෙ.ව.10.30 ට මෙම කාර්යාලයේ දී සිදුකරනු ලබන අතර, මෙම අවස්ථාවට ලංසුකරුට හෝ ඔහුගේ නියෝජිතයෙකුට සහභාගීවිය හැකිය.

| සේවාවේ ස්වභාවය | ආපසු ගෙවන ලංසු තැම්පත් මුදල රු. ශත | ලංසු පෝරම ගාස්තු | මසකට ඉල්ලුම් කල යුතු උපරිම ලංසුව රු. ශත |
|---|---|---|---|
| 01.බළන්ගොඩ නගරය තුළ එකතු කරනු ලබන ඝන අපද්‍රව්‍ය බැංකියවත්ත දක්වා ප්‍රවාහනය කිරීම.<br><br>02 නගරයේ මාර්ග පවිත්‍ර කිරීම.<br><br>03. පොදු වෙළඳසැල හා පොළ පිරිසිදු කිරීම.<br><br>04. බස්නැවතුම්පල සහිත වෙළඳ සංකීර්ණ ගොඩනැගිල්ල සහ අවට භූමිය පවිත්‍ර කිරීම.<br><br>05. කාපට් කරනු ලැබූ මාර්ග වල වැලි ඉවත් කිරීම. | 10,000/- | 1,000 vat 12% ජා.ගො.බදු 3% | 202,335/- රඳවා ගැනීමේ බද්ද 5% වේ. |

ඩබ්.එම්.එන්.පී.වීරසිංහ,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.

2009 ක් සැප්තැම්බර් මස 08 වන දින,
බළන්ගොඩ නගර සභා කාර්යාලයේ දී